Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
|---|---|
| | |

Centre Number | Candidate Number

# Pearson Edexcel International GCSE (9–1)

**Time** 2 hours 30 minutes

**Paper reference** **4SI1/01**

# Sinhala

## PAPER 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided
  *– there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets
  *– use this as a guide as to how much time to spend on each question.*

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.

*Turn over* ▶


©2022 Pearson Education Ltd.

## SECTION A: READING

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒. If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒. Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

**1** පහත සඳහන් පාඨය කියවා එම තොරතුරුවලට අනුව දී ඇති **සිංහල** වාක්‍යවල හිස් තැන් පුරවන්න. වගුවේ ඇති පිළිතුරුවලින් නිවැරදි පදය තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

**සන්නිවේදනය හා තැපැල් සේවය**

අතීතයේ රජවරු අශ්වාරෝහකයන් අත පණිවුඩ යැවූහ. එම සන්නිවේදන ක්‍රමය පසු ගිය සියවස් දෙක තුළ නව මානයකට හැරිණි. එතැන් සිට ලිපි හුවමාරුව සිදු වූයේ තැපැල් සේවය හරහා ය. ලියුම් බෙදන්නන්ගේ සීනු නාදය ඇසීමටත්, සිය උපන් දිනයට සුබ පැතුමක් ලැබීමටත්, ළමයි ප්‍රිය කළහ. මුද්දර එකතු කිරීම ඔවුන්ගේ විනෝදාංශයක් විය.

ලංකාවට දුරකථන සේවාව හඳුන්වා දීමට පුරෝගාමී වූයේ ද තැපැල් සේවයයි. විවිධ තාක්ෂණික උපකරණ මගින් සන්නිවේදනයේ යෙදෙන අපි අද ඩිජිටල්කරණයට යට වී ඇති ලෝකයක ජීවත් වෙමු. මෙකල වැඩිහිටියන් සේ ම පාසල් ළමයි ද සංවාද සඳහා සමාජ මාධ්‍ය විශාල වශයෙන් භාවිත කරති.

පසු ගිය වසර කිහිපය තුළ ශ්‍රී ලාංකිකයන් විසින් අන්තර්ජාලය හරහා භාණ්ඩ මිල දී ගැනීම සීඝ්‍ර ලෙස ඉහළ යෑම හේතුවෙන් විදේශීය පාර්සල් මෙරටට පැමිණීම බහුල වී තිබේ. විද්‍යුත් තැපෑල භාවිතය නිසා තැපෑලෙන් යනෙන ලිපි ලේඛන සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. මධ්‍යම තැපැල් හුවමාරුවට යන අයෙකුට එහි බෙදා හැරීම පිණිස වර්ග කර ඇති ලියුම් ගණන කෙතෙක්දැ’යි බලා ගත හැකි ය.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA



P 7 1 0 7 6 A 0 2 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

| | | | |
|---|---|---|---|
| **A** අශ්වාරෝහකයන් | **B** ඩිජිටල්කරණය | **C** සන්නිවේදන | **D** ලිපි |
| **E** තැපැල්කරුවන් | **F** සතුටු | **G** අකීකරු | **H** සමාජ මාධ්‍ය |
| **I** මුද්දර | **J** තැපැල් සේවය | **K** ක්‍රමවේදය | **L** සංවාදය |
| **M** උපකරණ | | | |

| | | |
|---|---|---|
| **උදාහරණය:** | රජවරු අශ්වාරෝහකයන් අත පණිවුඩ යැවූහ. | *A* |
| **1** (a) | ……… ක්‍රමය වෙනස් වී ඇත. | |
| **1** (b) | තැපැල්කරුගේ සීනු හඬින් ළමයි ……… වූහ. | |
| **1** (c) | ……… එකතු කිරීම විනෝදාංශයකි. | |
| **1** (d) | මෙකල සන්නිවේදනය සඳහා ……… භාවිත කරති. | |
| **1** (e) | බඩු මිලට ගන්නා ……… නවීකරණය වී ඇත. | |
| **1** (f) | විද්‍යුත් තැපෑල ……… කෙරෙහි බලපායි. | |

**(Total for Question 1 = 6 marks)**

**2** ශ්‍රී ලංකාවේ කුඹල් කර්මාන්තය ගැන කථා කරන මෙම ළමුන් තිදෙනාගේ ප්‍රකාශ කියවා එම තොරතුරුවලට අනුව පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ එක් කතිරය බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට කතිර එකකට වඩා තිබිය හැකි අතර ඇතැම් විට එකක්වත් නොතිබිය හැකි ය.

## ශ්‍රී ලංකාවේ කුඹල් කර්මාන්තය

**නිරාශා**



අතීතයේ විසූ මිනිස්සු සරල ජීවිත ගෙවූ අතර මැටිවලින් වලං සැදූහ. වර්තමානයේ ඈත පිටිසර ගම්මානවල වෙසෙන ඇතැම් තරුණ තරුණියෝ සිය ගම් ප්‍රදේශවල ප්‍රමාණවත් රැකියා නොමැති නිසා පවුලේ රැකියාවක් ලෙස කරගෙන යන මැටි බඳුන් නිෂ්පාදනයට හවුල් වෙති. මැටි බඳුන් විශාල වශයෙන් ආහාර පිසීම සඳහාත් ජලය රැස් කර තබා ගැනීම සඳහාත් භාවිත කරති. එහෙත් ලෝහ බඳුන් භාවිතය බහුල වීම කුඹල් කර්මාන්තයේ පැවැත්මට අහිතකර ලෙස බල පා ඇත.

**ඇණ්ඩෘ**



දුෂ්කර ගම්මානවල ඇති රැකියා හිඟය නිසාත් තවමත් පළපුරුද්ද මත යැපෙන මෙම සාම්ප්‍රදායික කුඹල් කර්මාන්තයෙන් ප්‍රමාණවත් ආදායමක් ඉපැයිය නොහැකි නිසාත් එම කර්මාන්තයෙහි නියැළී සිටින නූතන ග්‍රාමීය තරුණ ප්‍රජාව නගරයේ ඇති විවිධ රැකියා සොයා යෑමට පටන් ගෙන තිබේ. තවද, වර්තමාන කාලයේ වෙසෙන බොහෝ දෙනෙක් කල් පවත්නා ලෝහවලින් තැනූ භාජනවලට වැඩි කැමැත්තක් දැක්වීම කුඹල් කර්මාන්තයේ පරිහානියට හේතුවක් වී ඇත.

**මුරලි**



අද දවසේ හැදෙන වැඩෙන තරුණ පිරිස මෙම වටිනා මැටි බඳුන් කර්මාන්තය ඉදිරියට කරගෙන යෑමට එතරම් කැමැත්තක් නොදැක්වුව ද අතිශය දක්ෂ ලෙස විසිතුරු මැටි බඳුන් නිෂ්පාදනය කරන ඇතැම් කෙනෙක් එම භාණ්ඩ අන්තර්ජාතික වෙළඳ පොළේ ඉතා ඉහළ මිල ගණන්වලට විකුණා ලාභ ලබති. අපේ රටේ ජීවත් වන මිනිසුන්ගෙන් අති බහුතරය මැටි වලන්වල පිසූ ආහාර අනුභව කිරීමට කැමති බව ප්‍රසිද්ධ කාරණයකි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

| | | නිරාශා | ඇණ්ඩෲ | මුරලි |
|---|---|---|---|---|
| **උදාහරණය:** | ඉතිහාසය ගැන කථා කරයි. | ☒ | ☐ | ☐ |
| **A** | පිටිසර ගම්වල රැකියා හිඟ බව කියයි. | ☐ | ☐ | ☐ |
| **B** | වෙනත් අමු ද්‍රව්‍යයකින් තැනූ භාජන ගැන පවසයි. | ☐ | ☐ | ☐ |
| **C** | මෙම ව්‍යාපාරයෙන් ලාභ නොලැබෙන බව කියයි. | ☐ | ☐ | ☐ |
| **D** | තරුණයින් කුඹල් කර්මාන්තයට අකමැති යැයි සිතයි. | ☐ | ☐ | ☐ |
| **E** | මැටි භාණ්ඩවලින් ධනය ඉපයිය හැකි බව කියයි. | ☐ | ☐ | ☐ |
| **F** | මැටි වලන්වල ආහාර හොඳින් ඉදෙන බව කියයි. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA

**3** වතු කම්කරු හා ගැමි ජනතාව පිළිබඳ පහත සඳහන් ලිපිය කියවන්න. පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් **සිංහල** වචන යොදා පුරවන්න.

**ශ්‍රී ලංකාවේ ගැමි දිවි පැවැත්ම**

තේ වැවිලිකරුවන් තම තමන්ගේ පදිංචිය සඳහා බංගලා නමින් හඳුන් වන නිවාස තමන් විසින්ම ඉදි කරගෙන ඇති අතර වතු කම්කරුවන්ගේ නවාතැන් සඳහා තේ වතු ඇති ප්‍රදේශවල 'ලයිම් කාමර' නමින් හඳුන්වන කුඩා කාමර පේළි විශේෂයක් එම වතුවලම ඉදි කර දී ඇත. මෙම තේ වතුවල වැඩ කරන කම්කරු ජනතාව බහුල වශයෙන් ජීවත් වන්නේ උඩරට කඳුකරයේ ය.

මෙම ගොවි කම්කරුවන්ගෙන් බහුතරයක් ඔවුන්ගේ දෙමව්පියන්, දූ දරුවන් හා ඔවුන්ගේ දරු මුණුපුරන් සමග ජීවත් වෙති. මෙම දරුවන්ගෙන් වැඩි පිරිසක් ගමේ පිහිටි පාසලට යන අතර ධනවත් උදවියගේ දූ දරුවෝ නගරයේ පිහිටි තත්ත්වයෙන් උසස් අධ්‍යාපනයක් ලබා දෙන ජාතික පාසල්වලට යති.

සාම්ප්‍රදායික ගම්වල වෙසෙන ගොවි කම්කරු කාන්තාවෝ හිමිදිරි පාන්දරින් අවදි වී උදෑසන ආහාර වේල පිළියෙළ කොට තම දූ දරුවන් පාසල් යැවීමට අවශ්‍ය කටයුතු සූදානම් කරති. ගොවියෝ පාන්දරින්ම තම කුඹුරුවල වැඩට යන අතර වතු කම්කරුවෝ උදේ 7.30ට පමණ සිය රාජකාරි අරඹති. තේ දලු නෙළන කාන්තාවෝ බොහෝ වේලාවක් තේ වතුවලම දවස ගෙවති.

ගමේ පාසලට යන දරුවෝ සාමාන්‍යයෙන් පාසල් කාලයෙන් පසු ක්‍රීඩා පිට්ටනිවලට ගොස් ක්‍රීඩා කරන අතර ඇතැම් දරුවෝ අතිරේක පංතිවලට ගොස් වැඩි දුර අධ්‍යාපනය ලබති. දුමාරයෙන් දූෂිත වාතය ද, කර්මාන්තශාලාවලින් බැහැර කරන රසායනික අපද්‍රව්‍යවලින් දූෂිත ජලය ද ඇති නගරයට සාපේක්ෂ ව ගමේ ළමයින්ට පිරිසිදු ජලය ද, ස්වාභාවික පරිසරය ද ලැබී ඇත.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**උදාහරණය:** මෙම ඡේදයෙන් කියවෙන්නේ ......**ගැමි ජනතාවගේ ජීවිත**...... ගැන යි.

(a) වැවිලිකරුවෝ ...................................................... ද කම්කරුවෝ ......................................................
ද පදිංචි වී සිටිති. **(2)**

(b) වතු කම්කරුවන් වැඩිපුර සිටින්නේ ...................................................... පළාතේ ය. **(1)**

(c) ගොවි කම්කරු පවුල් ...................................................... සමග ජීවිත් වෙති. **(1)**

(d) උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දෙන්නේ ...................................................... ය. **(1)**

(e) ගැමිලියන්ගේ උදෑසන කටයුතු දෙකක් වන්නේ ...................................................... හා
...................................................... ය. **(2)**

(f) ...................................................... උදෑසන රාජකාරියට වාර්තා කළ යුතු ය. **(1)**

(g) ළමයි පාසල් ඇරී ...................................................... හෝ ...................................................... යති. **(2)**

(h) ගමේ ළමයි ...................................................... හා ......................................................
යන ස්වාභාවික සම්පත් අත් විඳිති. **(2)**

**(Total for Question 3 = 12 marks)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** දයා රෝහණ අතුකෝරාල මහතාගේ **"පෞරුෂය දියුණු කරගත හැකි මග"** නමැති කෘතියෙන් උපුටා ගෙන සකසන ලද පහත සඳහන් ඡේදය කියවන්න.

**දක්ෂ කථිකයකු වීමට නම්**

"ප්‍රසිද්ධ දේශන පවත්වන්නට ඉගෙන ගන්නා ආධුනිකයකු වන ඔබ ශ්‍රාවක ප්‍රතිචාරවලට සවන් දීමට කැමැත්තෙන් සිටිය යුතු ය. ප්‍රවීණ කථිකයන් තම කථාවේ අන්තර්ගතයට ගැළපෙන ආකාරයට එය ඵලදායීව ඉදිරිපත් කිරීමට පොහොසත් වන නමුත් ආධුනිකයකුට එසේ කිරීම අපහසු ය.

මහජනයා අමතා හොඳ කථාවක් පවත්වන්නට බලාපොරොත්තු වන කථිකයකුට ඊට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමටත් තම ශ්‍රාවක සමූහයේ අභිලාෂය වටහා ගැනීමටත් මනා හැකියාවක් තිබිය යුතු ය. ඔබේ හඬට සවන් දීමෙන් පමණක් ශ්‍රාවකයාට ඔබ පවසන දෙය සම්පූර්ණයෙන් ම වටහා ගැනීම අසීරු ය. ඔබ පවසන දේ වඩාත් හොඳින් තේරුම් යන ආකාරයට ඔබේ අදහස් තහවුරු වන පරිදි අංග චලනයෙන් එය අවධාරණය කිරීම වැදගත් ය. ඔබේ මුහුණ හොඳින් සභාවට ප්‍රදර්ශනය වන ආකාරයට සිටීමෙන් හා ඔබේ දෑස් ශ්‍රාවකයන්ගේ දෑස් වෙත ම රඳවා තබා ගැනීමෙන් ඔබට ඔවුන්ගේ සම්පූර්ණ අවධානය දිනා ගැනීමට හැකි ය.

සාමාන්‍යයෙන් මිනිසුන් කතන්දර අසන්නට කැමති ය. එහෙත් පොත්වලින් උපුටා ගත් පේළි එලෙස ම ප්‍රකාශ කිරීම අනිවාර්යයෙන් ම අත් හළ යුතු ය. එසේ කිරීමෙන් ඔබේ කථාව නීරස විය හැකි ය. ස්වාභාවික ව කථාවක් පවත්වන විට එය රසවත් වේ.

ඔබ හොඳින් දන්නා විෂයක් ගැන කථා කරන විට බොහෝ දේ සරල අදහස් කිහිපයකට ගොනු කළ හැකි ය. කථාව දීර්ඝ වන බැවින් එකම දේ නැවත කීමෙන් වළකින්න.

පිටපත සකස් කර ගැනීමෙන් අනතුරුව කථාව හොඳින් පුහුණු විය යුතු අතර මාතෘකාවෙන් බැහැර ව කිසිවක් කථා නො කරන්න. හාස්‍යය මුසු කිරීමෙන් අසන්නන්ගේ සිත් තුළ ඔබේ මුද්‍රාව තැබිය හැකි ය. ඉහත කරුණු පිළිපැදීමෙන් ඔබට ආත්ම විශ්වාසය හා උසස් ප්‍රමිතියක් ඇති කථිකයකු විය හැකි ය."

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** (a) පාඨයේ ඇති තොරතුරුවලට අනුව අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න.
පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) ලේඛකයා ආධුනික කථිකයන්ට ලබා දෙන අවවාදය කුමක් ද? **(1)**

.......................................................................................................................................

(ii) ආධුනිකයකු කථාවක් ඉදිරිපත් කිරීමේ දී පරෙස්සම් විය යුතු කරුණු දෙක මොනවා ද? **(2)**

.......................................................................................................................................

.......................................................................................................................................

(iii) කථාවක් සැළසුම් කිරීමේ දී කථිකයකු සැලකිය යුතු මූලික කරුණු මොනවා ද?
දෙකක් ලියන්න. **(2)**

.......................................................................................................................................

.......................................................................................................................................

(iv) ඔබේ කථාව අසන්නාට පහසුවෙන් අවබෝධ වන ලෙස පවත්වන්නේ කෙසේ ද? **(1)**

.......................................................................................................................................

(v) ශ්‍රාවකයන්ගේ දෑස් දෙස ම බලා ගෙන කථා කිරීමේ ඇති වැදගත්කම කුමක් ද? **(1)**

.......................................................................................................................................

(vi) මූලාශ්‍ර එලෙසින් ම උපුටා දැක්වීමෙන් අසන්නන් කෙරෙහි ඇති වන බලපෑම කුමක් ද? **(1)**

.......................................................................................................................................

(vii) ඔබේ කථාව සංක්ෂිප්ත කළ හැක්කේ කෙසේ කිරීමෙන් ද? **(1)**

.......................................................................................................................................

(viii) ශ්‍රාවක සිත්වල මතක හිටින ආකාරයට කථාවක් පවත්වන්නේ කෙසේ ද? **(1)**

.......................................................................................................................................

**4** (b) පාසලේ උදෑසන රැස්වීමේ දී විදුහල්පතිතුමා කළ කථාවට සවන් දීමෙන් පසු එම පාසලේ ළමුන් දෙදෙනෙකු කරන මෙම සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු දෙන්න.

සහිරා
අපේ විදුහල්පතිතුමා අද උදෑසන රැස්වීමේ දී පැවැත් වූ කථාව ඉතාම ආදර්ශමත් මෙන් ම සාරවත් කථාවක් හැටියටයි මා දකින්නේ. එහි මුල මැද අග ලස්සනට ගළපා තිබුණා. පිළිවෙළකට කථාවක් පැවැත්වීමට එතුමාට ඇත්තේ සුවිශේෂී හැකියාවක්. එතුමා මුළු කථාවම කිසියම් රිද්මයානුකූල ආකාරයකටයි, ගොඩනගා තිබුණේ. එතුමා කුමන මාතෘකාවක් ගැන කථා කළත් එය ඉතා අලංකාර ලෙසත් සිත් ඇද ගන්නා සුළු ආකාරයටත් පවත්වනවා. විදුහල්පතිතුමාගේ කථාව දැනුම් සාගරයක් වගෙයි මට දැනුණේ. සාමාන්‍යයෙන් එතුමා කථා කරන විට සාහිත්‍යයෙන්, විද්‍යාවෙන්, ඉතිහාසයෙන් හා ජීවිත අත්දැකීම්වලින් එය සාරවත් කරනවා. තවද, කවියකින් හෝ කියමනකින් හෝ ආප්තෝපදේශයකින් හෝ එතුමා කථාවට විශාල අරුතක් එක් කරනවා. නැතිනම් ප්‍රශ්නයක් නගා ඒ අනුසාරයෙන් කථා සන්දර්භය ගොඩ නගනවා. එසේත් නැති නම් විවෘත ප්‍රශ්නයක් අසා ඊට පිළිතුරු සෙවීම ශ්‍රාවයකයන් වෙත ම තබා එතුමා නිහඬ වෙනවා. මෙවැනි උපක්‍රම ඉගෙන ගැනීම පාසල් ළමුන් වශයෙන් අපට ඉතාම ප්‍රයෝජනවත්. එවැනි කථාවලට සවන් දීමෙන් බොහෝ දේ ඉගෙන ගන්න පුළුවන් වගේ ම ඒවාට සවන් දීම හරි ම රසවත් අත්දැකීමක්.

රොබින්
ඔබ කියන කාරණයට මමත් යමක් එක් කරන්න කැමතියි. මමත් ප්‍රසිද්ධ දේශනවලට සවන් දීමට කැමති අයෙක්. මට හිතෙන විදිහට හොඳ කථාවකට සවන් දීමෙන් මහ පොතක් කියවා ලැබිය යුතු තරමේ දැනුමක් එක වරම ලබා ගත හැකියි. කථාවකට සවන් දීම පොතක් කියවන තරම් ම අමාරුත් නැහැ. පොත් කියවීම මට නම් හරි ම වෙහෙස කර දෙයක්. එමෙන් ම පොත් බොහොමයක් නීරසයි; නැති නම් ඒකාකාරියි. පොත් පත්වල ලියා ඇති භාෂාව කථා කරන භාෂාව තරම් ම අපට සමීපත් නැහැ කියලයි මට හිතෙන්නේ. යූ ටියුබ්, මුහුණු පොත වැනි සමාජ මාධ්‍යවල නොමිලයේ ම නැරඹිය හැකි හොඳ වැඩ සටහන් තිබෙන නිසා ආධුනිකයන් වශයෙන් අපට කථා කරන හැටි ඉගෙන ගන්න දැන් හරි ම පහසුයි. එම වැඩසටහන්වල ලෝකයේ සිටින ප්‍රවීන කථිකයන්ගේ කථා ඇතුළත් වීඩියෝ පට දහස් ගණනක් තිබෙනවා. ඇත්තෙන් ම අද දවසේ ප්‍රබල කථිකයෙකු වීමට ඉගෙන ගැනීම ඉතාම පහසුයි.

(i) පළමු කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- විදුහල්පතිතුමා ප්‍රසිද්ධ කථිකයකු වශයෙන්: **(1)**
- විදුහල්පතිතුමාගේ කථාවේ ඇති ලක්ෂණ: **(1)**

..................................................................................................................................................

..................................................................................................................................................

(ii) දෙවන කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- පොත් කියවීමට වඩා දේශනයකට සවන් දීමේ ඇති අගය: **(1)**
- නූතනයේ සාර්ථක කථිකයෙකු විය හැකි ක්‍රම: **(1)**

..................................................................................................................................................

..................................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA

## SECTION B: WRITING

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

**උපන් දින සැමරුම**

පවුලේ උත්සවවල ඇති වටිනාකම

ඔබ අන්තිමට සහභාගී වූ උපන් දින සාදය

උපන් දිනට යෝග්‍ය විනෝද ක්‍රියා

ඔබේ ඊළඟ උපන් දින සාදයේ සැලසුම්

වචන 85ක් පමණ භාවිත කරමින් උපන් දින සැමරුමක් ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඉහත සඳහන් වචන සියල්ල ම භාවිත කළ යුතු ය.



DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් විකල්ප තුනෙන් එකක් තෝරාගෙන වචන 145ක පමණ **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඔබ තෝරාගත් විකල්පයට අදාළ ව පිළිතුරු සපයන්න.

## පළමු විකල්පය

(a)



ආහාර පිළිබඳ ව ලක්වැසි ජනතාව දක්වන ආකල්ප ගෙන හැර දක්වමින් නිරෝගීමත් දිවි පැවැත්මකට අත්‍යවශ්‍ය පුරුදු ගැන ස්වදේශීය සඟරාවකට බ්ලොග් සටහනක් රචනා කරන්න. ඔබේ බ්ලොග් සටහනේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- ඔබ ගන්නා එදිනෙදා ආහාර
- පාරම්පරික ආහාර වර්ගවලට ඔබ දැක් වූ කැමැත්ත
- මිල දී රැගෙන ගොස් බුදින ආහාර හා වීදි ආහාරවල අනාගතය

**(26)**

## දෙවන විකල්පය

(b)

"තාරුණ්‍යය" යන නමින් පවත්වන යොවුන් සාහිත්‍ය තරඟාවලියට යැවීම සඳහා රචනාවක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- වත්මන් තාරුණ්‍යයේ ලැදියා
- දශක කිහිපයකට ඉහත පැවති තාරුණ්‍යය
- අනාගත තරුණ පරපුර හමුවේ පවතින අභියෝග

**(26)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**තෙවන විකල්පය**

(c) ඔබ සමග නිවාඩුවක් ගත කිරීමට පැමිණෙන්නැ'යි ඉල්ලා යහළුවෙකුට ලිපියක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- මිනිසුන්ට නිවාඩු කාලයක් අවශ්‍ය වන්නේ ඇයි
- ඔබ වඩාත් විනෝද වූ නිවාඩු කාලයක්
- ඉදිරි වර්ෂයේ නිවාඩු කාලය සඳහා සැලසුම්

**(26)**

**Indicate which question you are answering by marking a cross ☒ . If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒ .**

☒ **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 6 = 26 marks)**

**TOTAL FOR SECTION B = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

## SECTION C: TRANSLATION INTO SINHALA

**Write your answer in the space provided.**

**7** පහත සඳහන් ඡේදය **සිංහලට** නගන්න.

Sri Lanka is a small island in the Indian ocean and is an easy country to get around. The train trip from Ella to Kandy, or the other way round, is considered to be one of the most beautiful train trips in the world. This is a seven-hour long journey and takes you through stunning landscapes of green and lush tea plantations and mountain views. The journey is very popular both among tourists and the locals. You can buy tickets either online or at any train station in Sri Lanka for the date you want.

**(20)**

**(Total for Question 7 = 20 marks)**

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**

BLANK PAGE

**Source information**

**Question 2**
© hadynyah/Getty Images
© hadynyah/Getty Images
© hadynyah/Getty Images

**Question 6**
© helovi/Getty Images

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA